# එම්. කේ. බී. ජයසේකර එ. මහජන බැංකුව

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/293/2018 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 2018.07.17 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල

**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන

**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවි තිරුචන්ද්‍රන්

**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් -** පියතිස්ස රණසිංහ

**අභියාචක -** එම් කේ බී ජයසේකර

**නොතීසි ලත් පාර්ශව -** නම්කළ නිලධාරී, මහජන බැංකුව

**පෙනීසිටීම**

**අභියාචක -** එම් කේ බී ජයසේකර

නීතිඥ පී කේ ප්‍රින්ස් පෙරේරා

**පොදු අධිකාරිය -** ඩබ්ලිව් ටී අයි අබේපිටිය, නීති නිලධාරී, මහජන බැංකුව

එන් ජී ටී කල්පනී

ඩී කේ ලියනගේ

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 2017.02.17, 2017.04.20 හා 2017.05.02 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 2017.21.03, 2017.04.25 හා 2017.06.23 |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 2017.04.25 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 2017.08.16 |
| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 2018.02.27 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක, 2017.02.17, 2017.04.20 හා 2017.05.02 දින ලිපි මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව වෙත කරන ලද යෝජනා අංක 5000 වූ ලිපියට අදාලව, දෙපාර්ශවයම පිළිගත හැකි තීරණයකට එළඹීමට කටයුතු කළේ නම් මහජන බැංකු සභාපති තුමා ඒ සම්බන්ධව සාකච්ඡාවකට මා කැඳවන ලද ලිපියේ සහතික පිටපතක්
2. උපදේශන කාරක සභාවෙන් කරන ලද ඉල්ලීම සහිත වූ ලිපියේ සහතික පිටපතක්
3. විශ්‍රාම වැටුපට අමතරව රුපියල් ලක්ෂ 30 ක වන්දි මුදල ලබා ගැනීමට එකඟ වූයේ නම් එම යෝජනාව සහිත වූ ලිපියේ පිටපතක්
4. HRC/1443/99 2007.07.27 දිනැති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමට හේතුව
5. COMP/PP/2008/10620 2009.12.21 දිනැති පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව විසින් කරන ලද නිර්දේශ නොසලකා හැරීමට හේතුව
6. සේවක නිවාස ණය යටතේ ලබාගත් පදිංචි නිවාස හා දේපල වෙන්දේසි කර ණය හිඟ පියවා ගැනීමට කටයුතු කිරීමට හේතුව, ඒ සඳහා පොලී ගණනය කල ආකාරය සහ 2001.10.22 දිනට ලබා ගෙන තිබූ අනෙකුත් හිඟ ණය ශේෂයන් පිළිබඳ පරිගණක කරන ලද වාර්තාවක් පොලී ගණනය කර ඇති ආකාරය සමඟින් සඳහන් කල සහතික පිටපතක්
7. වැඩතහනමට ලක්ව සිටි කාලය තුල අඩ වැටුප් නොගෙවීම සහ විනය පරීක්ෂකගේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමට හේතු දක්වමින් වාර්තාවක්
8. වෙවිවැ/ප්‍රකළ/පරණ/ඒ 2017.06.23 දිනැති ලිපිය මඟින් පරිගණක පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේදී වැටුප දෙගුණයක් වූයේ කෙසේද යන්න දෝෂය සිදුවූ ආකාරය සම්බන්ධ පරිගණක වාර්තාවේ සහතික පිටපතක් (2015ඔක්තෝබර් සිට 2017.06.23දක්වා), විශ්‍රාම වැටුප් ගණනය සිදු කරන ලද්දේ උපදේශන කාරක සභාවේ තීරණය මත ද යන්න පැහැදිලි කරමින් වාර්තාවක් සහ එකී දෝෂයන් සිදු කරන ලද පරිගණක ක්‍රියාකරුවන් සහ එය අනුමත කල නිලධාරීන් වෙනුවෙන් ගන්නා ලද විනය ක්‍රියාමාර්ගයන් සහ එම සේවකයන්ගේ නම් සහ සේවක අංක

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ පදනම විමසන ලදුව පොදු අධිකාරිය පවසා සිටියේ ඉල්ලා සිටින ලද තොරතුරු පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ රහස්‍යමය තොරතුරු වන බවත් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 5(1)(එ) හා 29 වගන්ති ප්‍රකාරව ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ බවයි.

**නියෝගය:**

පොදු අධිකාරිය තොරතුරු දැනගැනීමේ පනතේ 5(1)(එ) හා 29 වගන්ති ප්‍රකාරව ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එම තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට අදාලව ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය සතු වේ.

පනතේ 5(1)(එ) වන වගන්තිය මෙසේ සඳහන් කරයි;

“29(2)(ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම තොරතුරු තෙවන පාර්ශවයක් විසින් අදාළ පොදු අධිකාරිය වෙත රහසිගතව සපයා ඇති අවස්ථාවකදී, එම තොරතුරු හෙළිදරවු කිරීම සඳහා එම පාර්ශවය විසින් අනුමතය ලබා දී නොමැති අවස්ථාවක,”

තවද,

පනතේ 29(1) වන වගන්තිය මෙසේ සඳහන් කරයි;

"යම් පුරවැසියෙකු විසින් තොරතුරු නිලධාරියෙකුගෙන් ඉල්ලා ඇති තොරතුරු, තුන්වන පාර්ශවයකට අදාළ හෝ තුන්වන පාර්ශවයක් විසින් සපයන ලද අවස්ථාවක දී සහ එම තොරතුරු සපයනු ලබන අවස්ථාවෙදී එය රහසිගත තොරතුරක් වශයෙන් සලකනු ලැබූ අවස්ථාවක, තොරතුරු සැපයීමේ නිලධරයා විසින් එම ඉල්ලීම ලැබීමෙන් දින හතක් ඇතුලතදී, එම තොරතුරු හෙළිදරවු කිරීමට පක්ෂව හෝ විරුද්ධව එකී තුන්වන පාර්ශවය විසින් නිවේදන ලැබී දින හතක කාලයක් ඇතුළත නියෝජන ඉදිරිපත් කරන ලෙස ලිඛිත නිවේදනයක් නිකුත් කිරීම මගින් එකී තුන්වන පාර්ශවය වෙත ආරාධනා කරනු ලැබිය යුතුය."

ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීමේ හැකියාව පිළිබඳව පාර්ලිමේන්තු මහ ලේකම්වරයාගෙන් ලිඛිත ප්‍රකාශයක් ගෙන ඒ සම්බන්ධව කොමිෂන් සභාවට 2018.09.04 දින හෝ ඊට ප්‍රථම දැනුම් දෙන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කර සිටිමු.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 2018.09.04

---

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/293/2018 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 2018.09.04 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති** - මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික** - ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික** - ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික** - විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්‍ෂ ජනරාල්** - පියතිස්ස රණසිංහ

**අභියාචක** - එම් කේ බී ජයසේකර
**නොතීසි ලත් පාර්ශව** - නම්කළ නිලධාරී, මහජන බැංකුව
**පෙනීසිටීම**
**අභියාචක** - එම් කේ බී ජයසේකර
නීතිඥ පී කේ ප්‍රින්ස් පෙරේරා
**පොදු අධිකාරිය** - ඩී. එම්. පි .එස්. දිසානායක, නීති නිලධාරී, මහජන බැංකුව

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගයේදී, පොදු අධිකාරිය , මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂක සේරසිංහ මහතා, පොදු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමුකර ඇති බවත් එමගින් අදාළ වාර්තාව මුදල් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ ලේකම් වෙතින් ලබා ගත හැකි බවත් දන්වන ලදී.

එම හේතුව නිසා, අදාළ වාර්තාව/ ඉල්ලූ තොරතුරු ලබා ගැනීමට ඇති පහසුම මාර්ගය ඒ බවත් පොදු අධිකාරිය විසින් පෙන්වා දෙන ලදී.

කොමිෂන් සභාව, අදාළ වාර්තාව, පොදු අධිකාරියේ සන්තකයේ, භාරයේ සහ පාලනයේ ඇත්දැයි විමසන ලදුව පවසා සිටියේ, අදාළ වාර්තාවේ පිටපතක් පොදු අධිකාරිය සතු බව ය.

ඉල්ලා සිටින ලද තොරතුරු පොදු අධිකාරියේ සන්තකයේ පවතින බැවින් හා මෙම අභියාචනය සඳහා පොදු අධිකාරිය ලෙස මහජන බැංකුව නම් කර ඇති බැවින් ඉල්ලා සිටින ලද තොරතුරු මුදල් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ ලේකම් වෙතින් ලබා ගත හැකිය යන ප්‍රකාශය පිළිගත නොහැකි බවත් පනත ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය බැඳී සිටින බවත් පොදු අධිකාරියේ අවධානයට යොමු කරන ලදී.

ඉල්ලා සිටින ලද තොරතුරු නිකුත් කිරීම සම්බන්ධ වැඩිදුර පියවර ගැනීම සඳහා 2012.10.23 දිනට මෙම අභියාචනය කල් තබන ලදී.

---

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/293/2018 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 2018.10.23 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් -** පියතිස්ස රණසිංහ

**අභියාචක -** එම් කේ බී ජයසේකර
**නොතීසි ලත් පාර්ශව -** නම්කළ නිලධාරී, මහජන බැංකුව

**පෙනීසිටීම**
**අභියාචක -** එම් කේ බී ජයසේකර
**පොදු අධිකාරිය -** පැමිණ නැත

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

**පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි නීතිඥයින්ට පෙනී සිටීම සඳහා පුද්ගලික දුෂ්කරතාවයක් ඇති හෙයින් , 2014.10.15 දිනැති ලිපිය මගින් පොදු අධිකාරිය තව දුරටත් දිනයක් ඉල්ලා සිටින ලදී.**

ඉල්ලා සිටින ලද තොරතුරු නිකුත් කිරීම සම්බන්ධ වැඩිදුර පියවර ගැනීම සඳහා 2017.11.13 දිනට මෙම අභියාචනය කල් තබන ලදී.